# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## මූලික පිරිවෙන් අවසාන විභාගය - 2021(2022)

2022 මැයි මාසයේ දී පැවැත්වීමට නියමිත "මූලික පරිවෙන් අවසාන විභාගය - 2021(2022)" සඳහා අයදුම්පත් භාරගනු ලැබේ. අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව උක්ත විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි මූලික පිරිවෙන්, මහ පිරිවෙන් හා බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනවලින් පමණක් බැවින් පසුගියවර විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ සෑම ලියාපදිංචි මූලික පිරිවෙනකට, මහ පිරිවෙනකට හා බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනයකටම අදාළ අයදුම්පත් මේ වනවිට තැපැල් මගින් එවා ඇත.

02. 2022 පෙබරවාරි මස 15 දින වන විටත් අයදුම්පත් නොලත් ලියාපදිංචි මූලික පිරිවෙනක් හෝ මහ පිරිවෙනක් හෝ බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනයක් හෝ වේ නම්, තම ආයතනයෙන් ඉදිරිපත් කරන අයදුම්කරුවන් සංඛ්‍යාව සඳහන් කර, අයදුම්පත් මෙම දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් ඉල්ලුම් කළ යුතුය.

03. මෙම විභාගයට ඉදිරිපත් වන බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය අයදුම්පත් සතියේ දිනවල කාර්යාල වේලාවන් තුළදී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත පැමිණ ලබාගත හැකි අතර, තැපෑලෙන් ලබා ගැනීම සඳහා තම නම හා ලිපිනය ලියූ රු. 15.00 වටිනාකමකින් යුත් මුද්දර ඇලවූ 9x4 ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග 2022 පෙබරවාරි මස 15 වන දිනට පෙර පහත සඳහන් ලිපිනයෙන් ඉල්ලුම් කළ යුතුය. එම ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මූලික පිරිවෙන් අවසාන විභාගය - 2021(2022)" යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් (www.doenets.lk) බාගත කිරීමටද පහසුකම් සලසා ඇත. කිසියම් අයදුම්කරුවකුට මේ සම්බන්ධ ගැටලුවක් ඇතොත් දුරකථන අංක 011-2785230 හෝ 011-2786150 මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා උපදෙස් ලබාගත හැකිය.

04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2022 මාර්තු මස 10 වන දින වේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ." යන ලිපිනයට යොමු කළ යුතු අතර, අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මූලික පිරිවෙන් අවසාන විභාගය - 2021(2022)" යනුවෙන් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එල්.එම්.ඩී. ධර්මසේන
විභාග කොමසාරිස් ජනරාල්

5/5/4/8/2021
ආයතනික විභාග සංවිධාන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2022 පෙබරවාරි මස 10 වන දින.